සන්නස
නව සහශ්‍රය
SANNASA

**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක
**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**

සාමන්ත තැන්නගේ Saamantha Tennege

**Horizon -** Jagath J Edirisinghe

**සමබන්ධීකරණය**

| **NSW** | **WA** |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

### විභාගෙ විභාගේ.....

ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වී ඇති බොහෝ දෙනෙක් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා තමන් උපයන ධනයෙන් විශාල ප්‍රමාණයක් වියදම් කරති. දන් පැවැත්වෙන වීසීඊ තරග විභාගයට සූදානම් වීම පිණිස පෙර පුහුණු පන්ති වලට දරුවන් කෙතරම් නම් යොමු කරන්නේද යන්න අපි අත්දැකීමෙන් දනිමු. සියලු දෙනාගේම අපේක්ෂාව වන්නේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීම ය. එය ඉතා යහපත් චේතනාවකි. එනමුදු ඒ සඳහා දරුවන්ගේ ළමා කාලය මුලුමනින්ම කැප කිරීම ඔස්ට්‍රේලියාව වැනි රටකට කෙතරම් ගැලපේද යන්න ගැන දෙවරක් සිතිය යුතුය.

ශ්‍රී ලංකාවේදී අපට හුරු පුරුදු වී ඇති දරුවන් දොස්තරවරුන් ඉංජිනේරුවන් කිරීමේ සිහිනය ගෙඩි පිටින්ම මේ රටවලටද කර තබාගෙන පැමිණ ඇත. ඒ සඳහා ලකුණු 98% ක් ලබා ගැනීමට දරුවන් තරග පිටියට දමා බලා සිටින අපේ දෙමාපියන් දකින විට ඇති වන්නේ කණගාටුවකි. කණගාටුව දෙමාපියන් ගැන නොවේ. දරුවන් ගැන ය.

ශ්‍රී ලංකාවේදී මෙන් නොව මෙහිදී දරුවන්ට සියලු සැප පහසුකම් ලබා දෙන බැවින් දරුවන් උපරිම ලකුණු ප්‍රමාණය කෙසේ හෝ ලබා ගත යුතු යයි දෙමාපියෝ සිතති. ඒ අපේක්ෂාව සාක්ෂාත් කරගනු වස් දරුවන් උපකාරක පන්ති තුළට ගාල් කිරීම නිසා දරුවෝ උපකාරක පන්ති වල සිරකරුවන් බවට පත්ව සිටිති. සැබැවින්ම විභාග භීතිකාව වැළඳී ඇත්තේ දරුවන්ට නොව දෙමාපියන්ට ය.

මේ මහා තරගය නිසා 12 වසරේ බොහෝ දරුවනට නිදහස කියා දෙයක් ඇත්තේම නැති තරමට තත්වය භයානක වී ඇත. සියලු බාහිර ක්‍රියාකාරකම් වලින් මිදී විභාගය හා දැහැන් ගත වීමට දරුවන්ට සිදුවී ඇත.

ලංකාවේ මෙන් නොව ළමුන්ට තම දැනුම හා හැකියාව ඔස්සේ ඉදිරියට යා හැකි අපමණ මාර්ග ඇති මෙවන් රටවල දීත් දරුවාගේ ජීවිතය තීරණය වන්නේ විභාගය මත පමණක්ය යන මතයේ සිටින දොමාපියන් දකින්නට ලැබීම කණගාටුවට කරුණකි. විභාගය යනු ළමයකුගේ ශක්තිමත් අනාගතය ගොඩ නගන එක් සාධකයක් පමණක්ය යන්න මේ බොහෝ අය නොදනිති.

මානව සාර ධර්ම වලට ගරු කරන ශක්තිමත් පෞරුෂයක් ඇති දරුවකු බිහි කිරීම සඳහා අවශ්‍ය වන්නේ අධ්‍යාපනය තුළ දරුවන් සිර කිරීම නොව නිදහස් නිරවුල් මනසින් අධ්‍යාපනය ලැබීමට අවශ්‍ය පරිසරය දරුවාට තනා දීම ය. ඒ සඳහා දරුවනට පෙර දෙමාපියන්ට ජීවත් වීම යනු කවරක්දැයි යන්න පිළිබඳව සැබෑ අවබෝධයක් තිබිය යුතු ය.



**මේජර් ජනරාල් සරත් ෆොන්සේකා ලංකාව ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමට පර්යායව ලංකාව දෙමලුන්ගෙන් මුදා ගැනීමේ ව්‍යාපෘතියකට ද නායකත්වය දෙන්නට අපේක්‍ෂා කරන බව ඔහුගේ 'නැෂනල් පෝස්ට්' කුප්‍රකට සම්මුඛ සාකච්ඡාවෙන් පෙනේ. එහිදී ඔහු පවසා සිටියේ ලංකාව සිංහලයන්ගේ රට බවත්, අනෙකුත් ජාතීන්ට එහි ජීවත්විය හැක්කේ මහා ජාතියේ හිත හොඳකම මත ඔවුන්ගේ ආශිර්වාදය යටතේ පමණක් බවත්ය. මෙය දේශපාලනිකව ඉව අල්ලන්නකුගේ ප්‍රකාශයක් හැර අන් කවරක්ද?**

# සරත් ෆොන්සේකා
# වසඟය හා යතාර්ථය

චන්ද්‍රරත්න බණ්ඩාර

දේශපාලන උත්තුංග භාවය (සම්ප්‍රදායන් හා සාර අංග ඇතුලත්) වියැකී යන සමාජයක දේශපාලනික නොවන පුද්ගලයන් දේශපාලනික ක්‍ෂෙත්‍රයට පැමිණීම බලාපොරොත්තු විය යුත්තකි. සාමාජීය නොවන ක්‍ෂෙත්‍රයන්ට, විශිෂ්ට සම්ප්‍රදානයන් කළ විශිෂ්ටයන්, තමන් මැනවින් නොදන්නා දේශපාලනයට පැමිණ, සුවිසාල අපරාධයන්ට හවුල් කාරයන් වන්නේ යැයි වරෙක ලෙනින් ලිවීය. එදත් අදත් දේශපාලන ක්‍ෂෙත්‍රයට අදේශපාලනික මිනිසුන්ගේ සම්ප්‍රාප්තිය ව්‍යසනයක් වූ අතරම එය රටට යහපතක් නොවුනේමය.

නූතන විද්‍යාත්මක චින්තනයේ පියා ලෙස හඳුන්වන, ඇල්බට් අයිස්ටයින් ඔහු ජීවත්ව සිටි අවධියේ, යුදෙව් ජාතියට සිටි විශිෂ්ටතමයා විය. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව මිතුරු ජාතීන් එකතුව පිහිටවූ ඊශ්‍රායලයේ අගමැතිවරයා වන්නට පළමු ආරාධනය ලැබුණේ, අයිස්ටයින්ට හටය. එම වැදගත් ආරාධනය ප්‍රතික්ෂේප කරමින් අයින්ස්ටයින් පැවසුවේ, කිසිවක් නොදන්නා ක්‍ෂේත්‍රයක නායකත්වය භාර ගැනීමට තමන්ට කළ නොහැකි දෙයක් බවයි.

දේශපාලනය යනු රටක් පවත්වාගෙන යන, එය අනාගතය වෙත කැඳවාගෙන යන, යාත්‍රාවයි. එය අනෙකුත් සියලු ක්‍ෂෙත්‍රයන්ට ඉදිරියෙන් සිටී. ඒ යාත්‍රාව පැදවිය යුත්තේ ඒ සඳහා ප්‍රගුණ කළ හැකියාවන් සහිත මිනිසුන් පමණක්මය. එහෙත් මෙම සනාතන ධර්මතාවය, දේශපාලනයේ පරමාදර්ශයන් විනාශ කරගත් රටවල් හා සමාජයන් පිළි නොගනිමින් තිබේ.

සිනමා නලුවන්, ක්‍රීඩකයන්, හමුදා ප්‍රධානීන්, වැනි අවශේෂ ක්‍ෂෙත්‍රයන්ට, මහත් සේවාවන් කළ පුද්ගලයන්, දේශපාලනයට පැමිණීමෙන් ඒ රටවල් හා ප්‍රාන්ත විනාශ වී ගිය අයුරු අපට ඉතිහාසය විසින් කියාදේ. පිලිපීනයේ ජෝෂප් ස්ට්‍රාඩා, ඉන්දියාවේ ඇම්. ජී. ආර්, ජයලලිතා, අමිතාබ් බච්චන්, රාම් රාඕ, පකිස්ථානයේ, බංග්ලාදේශයේ හා අප්‍රිකානු හා ලතින් ඇමරිකානු රටවල හමුදා නායකයින්, ආදීන් එක අතකින් දේශපාලනය හරිහම්බ කර ගැනීමට පාවිච්චි කළෝය. අනෙක් අතින් ඒ ඒ රටවල වැඩෙමින් තිබුනු ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මිනී වලටම ඇද දැමීය.

උගන්ඩාවේ බලයට පත්වූ ජෙනරාල් ඉඩි අමීන්ට වඩා ලංකාවේ මේජර් ජනරාල් සරත් ෆොන්සේකා පෞද්ගලික යහ පවැත්ම, රට කෙරේ දක්වන ආදරය, දූෂණයට දක්වන විරෝධය අතින් ඉහළ තලයක සිටිනවා විය හැකිය. එහෙත් දෙදෙනාම ප්‍රගුණ කළ විෂය වන්නේ දේශපාලනය නොවේ. ඔවුන්ගේ විශ්වාසය හා ක්‍රියාමාර්ග ගොඩ නැගෙන්නේ මර්ධනය මගින් ගැටලුව නිරාකරණය කිරීමේ පිළිවෙතයි. එම පිළිවෙත ප්‍රජාතන්ත්‍රවාදයට සපුරා විරුද්ධ ක්‍රියාදාමයකි.

ශ්‍රී ලංකාවේ අනාගත ජනාධිපති අපේක්‍ෂකයා ලෙස මේජර් ජනරාල් සරත් ෆොන්සේකා මහතා කැඳවා ගැනීමට දරණ උත්සාහයන්, ජනතා විමුක්ති පෙරමුණ හා එක්සත් ජාතික පක්‍ෂය ප්‍රමුඛ විපක්‍ෂ සන්ධානය පැත්තෙන් අසන්නට ලැබේ. එහෙත් එයට "හා" හෝ "හරි" යයි කියන්නට එක්සත් ජාතික පක්‍ෂ නායක රනිල් වික්‍රමසිංහ ඉදිරිපත් නොවීම එක අතකින් රටේ වාසනාවකි. මොන දූර්වලකම් තිබුණත් සමස්ථ විපක්‍ෂයේ සිටින දේශපාලනිකව දැනුවත් "දේශපාලනඥයා" යන අර්ථයෙන් ගත හැකි ඉහළම පුද්ගලයා රනිල් වික්‍රමසිංහ බව මගේ හැඟීමයි. ඔහුට නැත්තේ රටක් පාලනය කිරීමට ඇති හැකියාව නොව බලය ලබා ගැනීමට ඇති හැකියාවයි.

රණ කාමයේ මූර්ජාව

ලංකාවේ අද ගෙවී යමින් තිබෙන්නේ රණ කාමයෙන් මූර්ජාවට පත්වෙමින් සිට, ආර්ථික පීඩනය නිසා එයින් සුවපත් වෙමින් තිබෙන අවධියකි. යුද්ධය සාර්ථකව කෙරී ගෙන යන නිසාත්, පසුකාලීනව යුද්ධය ජයග්‍රාහිව කෙළවර කිරීම නිසාත්, යුද්ධයේ දේශපාලනික

29 වන පිටුවට